සංයුක්ත ගණිතය - I පත්‍රය
පිළිතුරු සඳහා මග පෙන්වීම

A කොටස

1. $n=1$ වන විට, ව.අ.පැ. $= \begin{pmatrix} 3 & -4 \\ 1 & -1 \end{pmatrix}$

ද.අ.පැ. $= \begin{pmatrix} 1+2\times 1 & -4\times 1 \\ 1 & 1-2\times 1 \end{pmatrix} = \begin{pmatrix} 3 & -4 \\ 1 & -1 \end{pmatrix}$ ව.අ.පැ.

$\therefore n=1$ සඳහා ප්‍රතිඵලය සත්‍ය වේ. (5)

$n=p$ වන විට ප්‍රතිඵලය සත්‍ය යැයි උපකල්පනය කරමු.

එවිට, $\begin{pmatrix} 3 & -4 \\ 1 & -1 \end{pmatrix}^p = \begin{pmatrix} 1+2p & -4p \\ p & 1-2p \end{pmatrix}$ (5)

$$\begin{pmatrix} 3 & -4 \\ 1 & -1 \end{pmatrix}^{p+1} = \begin{pmatrix} 1+2p & -4p \\ p & 1-2p \end{pmatrix}\begin{pmatrix} 3 & -4 \\ 1 & -1 \end{pmatrix} \quad (5)$$

$$= \begin{pmatrix} 3(1+2p)-4p & -4(1+2p)+4p \\ 3p+1-2p & -4p-(1-2p) \end{pmatrix}$$

$$= \begin{pmatrix} 3+2p & -4-4p \\ 1+p & -1-2p \end{pmatrix}$$

$$= \begin{pmatrix} 1+2(p+1) & -4(p+1) \\ (p+1) & 1-2(p+1) \end{pmatrix} \quad (5)$$

$\therefore n=p+1$ සඳහා ප්‍රතිඵලය සත්‍ය වේ.

$\therefore$ සියලු n ධන නිඛිල සඳහා ගණිත අභ්‍යුහන මූලධර්මයෙන් ප්‍රතිඵලය සත්‍ය වේ. (5)

$\boxed{25}$

---

2. $\left(\sqrt{5}+\sqrt{3}\right)^4+\left(\sqrt{5}-\sqrt{3}\right)^4$

$$= {}^4C_0\left(\sqrt{5}\right)^4+{}^4C_1\left(\sqrt{5}\right)^3.\sqrt{3}+{}^4C_2\left(\sqrt{5}\right)^2\left(\sqrt{3}\right)^2+{}^4C_3\left(\sqrt{5}\right)\left(\sqrt{3}\right)^3+{}^4C_4\left(\sqrt{3}\right)^4+{}^4C_0\left(\sqrt{5}\right)^4 \quad (5)$$
$$-{}^4C_1\left(\sqrt{5}\right)^3\left(\sqrt{3}\right)+{}^4C_2\left(\sqrt{5}\right)^2\left(\sqrt{3}\right)^2-{}^4C_3\left(\sqrt{5}\right)\left(\sqrt{3}\right)^3+{}^4C_4\left(\sqrt{3}\right)^4$$

$$= 2\left[{}^4C_0\left(\sqrt{5}\right)^4+{}^4C_2\left(\sqrt{5}\right)^2\left(\sqrt{3}\right)^2+{}^4C_4\left(\sqrt{3}\right)^4\right]$$

$= 2[25+6\times 15+9]$ (5)

$= 2\times 124$

$= 248$ ——— (1)

[2 වන පිටුව බලන්න

$$\left(\sqrt{5}+\sqrt{3}\right)\left(\sqrt{5}-\sqrt{3}\right) = 5-3=2 \quad (5)$$

$$\Rightarrow \left(\sqrt{5}-\sqrt{3}\right) = \frac{2}{\sqrt{5}+\sqrt{3}}$$

$$\Rightarrow 0<\left(\sqrt{5}-\sqrt{3}\right)<1 \quad (5) \quad \left(\because \sqrt{5}+\sqrt{3}>2\right)$$

$$\Rightarrow 0<\left(\sqrt{5}-\sqrt{3}\right)^4<1$$

$\therefore$ (1) න්, $0<248-\left(\sqrt{5}+\sqrt{3}\right)^4<1$

$$\Rightarrow 247<\left(\sqrt{5}+\sqrt{3}\right)^4<248$$

$$\Rightarrow n=247 \quad (5)$$

$\boxed{25}$

---

3. $(3-2i)(7-5i) = 21+10i^2-14i-15i$ (5)

$= 11-29i \quad (i^2=-1$ නිසා$)$ (5)

$\therefore 11+29i = (3+2i)(7+5i)$ (5)

$11^2+29^2 = 11^2-(29i)^2$

$= (11-29i)(11+29i)$

$= (3-2i)(7-5i)\,(3+2i)(7+5i)$

$= (9-4i^2)(49-25i^2)$ (5)

$= (9+4)(49+25)$

$= 13\times 74$ (5)

$\boxed{25}$

---

4. $$\lim_{x\to\frac{\pi}{2}} \frac{(2x-\pi)\cos x}{2\cos^2 x-\left(\frac{\pi}{2}-x\right)^2\sin x}$$

$$= \lim_{\left(x-\frac{\pi}{2}\right)\to 0} \frac{2\left(x-\frac{\pi}{2}\right)\sin\left(\frac{\pi}{2}-x\right)}{2\sin^2\left(\frac{\pi}{2}-x\right)-\left(\frac{\pi}{2}-x\right)^2\cos\left(\frac{\pi}{2}-x\right)}$$

(5)

$$= \lim_{\left(x-\frac{\pi}{2}\right)\to 0} \frac{-2\sin\left(x-\frac{\pi}{2}\right)\Big/\left(x-\frac{\pi}{2}\right)}{\dfrac{2\sin^2\left(x-\frac{\pi}{2}\right)}{\left(x-\frac{\pi}{2}\right)^2}-\cos\left(x-\frac{\pi}{2}\right)} \quad (5)$$

[3 වන පිටුව බලන්න

$$= \lim_{\left(x-\frac{\pi}{2}\right)\to 0} \frac{-2\dfrac{\sin\left(x-\frac{\pi}{2}\right)}{\left(x-\frac{\pi}{2}\right)}}{2\left[\dfrac{\sin\left(x-\frac{\pi}{2}\right)}{\left(x-\frac{\pi}{2}\right)}\right]^2 - \cos\left(x-\frac{\pi}{2}\right)}$$

$$= \frac{-2\left[\lim\limits_{\left(x-\frac{\pi}{2}\right)\to 0} \dfrac{\sin\left(x-\frac{\pi}{2}\right)}{\left(x-\frac{\pi}{2}\right)}\right] \quad 5}{2\left[\lim\limits_{\left(x-\frac{\pi}{2}\right)\to 0} \dfrac{\sin\left(x-\frac{\pi}{2}\right)}{\left(x-\frac{\pi}{2}\right)}\right]^2 - \lim\limits_{\left(x-\frac{\pi}{2}\right)\to 0} \cos\left(x-\frac{\pi}{2}\right)}$$

5

$$= \frac{-2\times 1}{2(1)^2-1} \quad 5$$

$$= -2$$

25

....

5. $$\frac{d}{dx}\ln\left(x+\sqrt{x^2+a^2}\right) = \frac{1}{\left(x+\sqrt{x^2+a^2}\right)}\cdot\left(1+\frac{1}{2}\cdot\frac{2x}{\sqrt{x^2+a^2}}\right) \quad 5$$

$$= \frac{1}{\left(x+\sqrt{x^2+a^2}\right)}\cdot\left(\frac{x+\sqrt{x^2+a^2}}{\sqrt{x^2+a^2}}\right)$$

$$= \frac{1}{\sqrt{x^2+a^2}} \quad 5$$

එවිට $$I = \int \frac{1}{\sqrt{9x^2+4}}\,dx = \frac{1}{3}\int \frac{1}{\sqrt{x^2+\left(\frac{2}{3}\right)^2}}\,dx \quad 5$$

$$\therefore I = \frac{1}{3}\left[\ln\left(x+\sqrt{x^2+\left(\frac{2}{3}\right)^2}\right)\right]+C$$; මෙහි C අභිමත නියතයකි.

5 + 5

25

....

6. $\left(\frac{dy}{dx}\right)_T = \frac{T(2-3T)}{(1-T)(1-3T)}$

$T = \frac{1}{2}$ විට

$\left(\frac{dy}{dx}\right) = \frac{\frac{1}{2}\left(2-\frac{3}{2}\right)}{\left(1-\frac{1}{2}\right)\left(1-\frac{3}{2}\right)} = -1$ 5

එවිට $(x, y) = \left(\frac{1}{8}, \frac{1}{8}\right)$ 5

ස්පර්ශකය මත පිහිටි ඕනෑම ලක්ෂ්‍යයක් (x, y) නම් ස්පර්ශකයේ සමීකරණය

$y-\frac{1}{8} = -1\left(x-\frac{1}{8}\right)$ 5

$4x+4y-1=0$

ස්පර්ශකය $t = T'$ ට අනුරූප ලක්ෂ්‍යයේදී වක්‍රය හා ඡේදනය වන්නේ යැයි ගනිමු.

එවිට $(x, y) = (T'(1-T')^2, T'^2(1-T'))$

$\Rightarrow \quad 4T'(1-T')^2 + 4T'^2(1-T') - 1 = 0$ 5

$4T'^2 - 4T' + 1 = 0$

$(2T'-1)^2 = 0$

$\Rightarrow T' = \frac{1}{2}$; මෙය දී තිබෙන ලක්ෂ්‍යයට අනුරූප පරාමිතිය වේ. 5

එබැවින් මෙම ස්පර්ශකය නැවත වක්‍රය හා හමු නොවේ.

එනම් වක්‍රය, $4x+4y-1=0$ ස්පර්ශකය අනුබද්ධව එකම පසක පිහිටයි.

$\boxed{25}$

7.



$A\hat{B}C$ යේ සමච්ඡේදක,

$\left|\frac{3x+4y+5}{\sqrt{3^2+4^2}}\right| = \left|\frac{3x-4y+1}{\sqrt{3^2+(-4)^2}}\right|$ මගින් දෙනු ලැබේ. 10

එනම්, $3x+4y+5 = \pm(3x-4y+1)$

$8y+4 = 0$ සහ $6x+6 = 0$

$2y+1 = 0$ සහ $x+1 = 0$ 5

$2y+1=0$ මගින් දෙනු ලබන සරල රේඛාව AC පාදයට සමාන්තර බැවින්, එය $A\hat{B}C$ යේ බාහිර සමච්ඡේදකය වේ. 5

$x+1=0$ සරල රේඛාව AC පාදයට ලම්බ වේ. එය $A\hat{B}C$ යේ අභ්‍යන්තර සමච්ඡේදකය වේ. 5

$\boxed{25}$

8. $ax^2 + 2y^2 + bxy + x + 4y + 2c = 0$ මගින් වෘත්තයක් නිරූපණය වීම සඳහා,

$a = 2, b = 0$ සහ $\left(\frac{1}{4}\right)^2 + 1^2 - c > 0$ විය යුතු ය. 5

$\therefore a = 2, b = 0$ සහ $c < \frac{17}{16}$. 5

$\therefore c$ හි ධන නිඛිලමය අගය 1 වේ.

එවිට වෘත්තය $2x^2 + 2y^2 + x + 4y + 2 = 0$

එනම් $x^2 + y^2 + \frac{1}{2}x + 2y + 1 = 0$

මෙහි කේන්ද්‍රය $\left(-\frac{1}{4}, -1\right)$ 5

$(x+p)^2 + y^2 = p^2 \Rightarrow x^2 + y^2 + 2px = 0$

වෘත්ත දෙකෙහි පොදු ජ්‍යාය : $(\frac{1}{2} - 2p)x + 2y + 1 = 0$

මුලින් දී ඇති වෘත්තයෙහි පරිධිය සමච්ඡේදනය වන නිසා, එහි කේන්ද්‍රය පොදු ජ්‍යාය මත පිහිටිය යුතු ය. 5

$\therefore \left(\frac{1}{2} - 2p\right)\left(-\frac{1}{4}\right) + 2(-1) + 1 = 0$

$\frac{1}{2}p - \frac{1}{8} - 2 + 1 = 0$

$p = \frac{9}{4}$ 5

25

---

9. $S_1 : x^2 + y^2 - 6x + 8y + 9 = 0 \Rightarrow C_1 = (3, -4)$, $r_1 = \sqrt{9+16-9} = 4$ 5

$S_2 : x^2 + y^2 - r^2 = 0 \Rightarrow C_2 = (0, 0)$, $r_2 = r$

S_1 හා S_2 වෘත්ත දෙක ස්පර්ශවීම සඳහා $C_1C_2 = r_1 + r_2$ හෝ $C_1C_2 = |r_1 - r_2|$

$5 = 4 + r$ හෝ $5 = |r - 4|$

$r = 1$ 5 $\quad r - 4 = \pm 5$

$r = 4 \pm 5$

$r > 0$ නිසා $r = 9$ 5

S_1 හා S_2 වෘත්ත අභ්‍යන්තරව ස්පර්ශ වන විට,
$C_2\,C_1$ රේඛාව, ස්පර්ශ ලක්ෂ්‍යය වන
P හිදී $C_2P : PC_1 = 9 : 4$
වන පරිදි බාහිරව බෙදේ. 5

$\therefore P \equiv \left[\frac{9\times 3 - 4\times 0}{9-4}, \frac{9\times(-4) - 4\times 0}{9-4}\right]$

$\equiv \left(\frac{27}{5}, -\frac{36}{5}\right)$ 5



25

[6 වන පිටුව බලන්න

10. cosine සූත්‍රයෙන්,

$$c^2 = a^2 + b^2 - 2ab\cos C$$

$$16 = 25 + 36 - 60\cos C \quad (5)$$

$$\cos C = \frac{45}{60}$$

$$= \frac{3}{4}$$

sine සූත්‍රයෙන්,

$$\frac{6}{\sin B} = \frac{4}{\sin C} \quad (5)$$

$$\Rightarrow \sin B = \frac{3}{2}\sin C \qquad \therefore \frac{\sin B}{\sin C} = \frac{3}{2} \text{ වේ.}$$

$$= 2 \times \frac{3}{4} \times \sin C$$

$$= 2\cos C\sin C \quad (5)$$

$$= \sin 2C$$

$\therefore\ \hat{B} = 2\hat{C}$ හෝ $\hat{B} = \pi - 2\hat{C}$; ($0 < \hat{A}, \hat{B}, \hat{C} < \pi$ නිසා) (5)

$\hat{A} \neq \hat{C}$ නිසා, $\hat{B} \neq \pi - 2\hat{C}$ වේ. ; ($\hat{A} + \hat{B} + \hat{C} = \pi$ නිසා) (5)

$\therefore\ \hat{B} = 2\hat{C}$ වේ.

$\boxed{25}$

B කොටස

11. (a) $\alpha + \beta = -b, \ \ \alpha\beta = c$ 5

$p + q \ = \ \alpha+\beta+\alpha^2+\beta^2 = (\alpha+\beta)+(\alpha+\beta)^2 - 2\alpha\beta \ = \ b^2 - b - 2c$ 5

$pq \ = \ \alpha^3+\beta^3+\alpha\beta+(\alpha\beta)^2 \ = (\alpha+\beta)^3 - 3\alpha\beta(\alpha+\beta)+\alpha\beta+(\alpha\beta)^2$

$= \ -b^3 + 3cb + c + c^2$ 5

$\therefore$ මූල p හා q වන වර්ගජ සමීකරණය,

$$x^2 - (b^2 - b - 2c)x - b^3 + 3cb + c + c^2 = 0$$ 5 + 5

$\boxed{25}$

මෙහි විවේචකය,

$\Delta_x \ = \ (b^2 - b - 2c)^2 + 4(b^3 - 3bc - c - c^2)$ 5

$= \ b^4 + b^2 + 4c^2 - 2b^3 + 4bc - 4b^2c + 4b^3 - 12bc - 4c - 4c^2$

$= \ b^4 + 2b^3 + b^2 - 4b^2c - 8bc - 4c$

$= \ b^2(b^2 + 2b + 1) - 4c(b^2 + 2b + 1)$

$= \ (b+1)^2(b^2 - 4c)$ 5

α හා β අතාත්ත්වික වන විට $b^2 - 4c < 0$ වේ. 5

$\therefore \ \Delta_x \leq 0$ වේ. 5

$\therefore \ b = -1$ නම් හා නම් ම පමණක් $\Delta_x = 0$ වේ. 5

එනම් $b = -1$ නම් හා නම් ම පමණක් p හා q තාත්ත්වික වේ.

මෙම අවස්ථාවේ දී $\Delta_x = 0$ බැවින් $p = q$ වේ. 5

එවිට $p + q \ = \ (-1)^2 - (-1) - 2c$ 5

$2p \ = \ 2 - 2c$

$p \ = \ 1 - c$

$\therefore p = q = \ 1 - c$

$\boxed{35}$

(b) $y = \dfrac{(x+2)^2}{x^2+x+1}$ ලෙස ගනිමු. 5

$\Rightarrow \quad (y-1)x^2 + (y-4)x + (y-4) = 0$ 5

$y = 1$ විට $x = -1$ වේ. එවිට වර්ගජ සමීකරණයක් නොපවතී.

$$\Rightarrow \quad (y-1)\left[\left(x+\frac{y-4}{2(y-1)}\right)^2 + \frac{(y-4)}{(y-1)} - \left(\frac{y-4}{2(y-1)}\right)^2\right] = 0 \quad (y \neq 1)$$

$$\Rightarrow \quad (y-1)\left[\left(x+\frac{y-4}{2(y-1)}\right)^2 + \frac{4(y-1)(y-4)-(y-4)^2}{4(y-1)^2}\right] = 0$$

$$\Rightarrow \quad (y-1)\left[\left(x+\frac{y-4}{2(y-1)}\right)^2 + \frac{(y-4)(4y-4-y+4)}{4(y-1)^2}\right] = 0$$

$$\Rightarrow \quad (y-1)\left[\left(x+\frac{y-4}{2(y-1)}\right)^2 + \frac{3y(y-4)}{4(y-1)^2}\right] = 0$$ 5

[8 වන පිටුව බලන්න

සියලු තාත්ත්වික x සඳහා, $\dfrac{3y(y-4)}{4(y-1)^2} \le 0$

$\Rightarrow \quad 3y(y-4) \le 0$, 5 $(y-1)^2 > 0$ බැවින්,

$\Rightarrow \quad 0 \le y \le 4$ 5

$\Rightarrow \quad 0 \le \dfrac{(x+2)^2}{x^2+x+1} \le 4$

$\Rightarrow \quad y_{අවම} = 0$ සහ $y_{උපරිම} = 4$ 5

$x^2+x+1 = \left(x+\dfrac{1}{2}\right)^2 + \dfrac{3}{4} > 0$ බැවින්, $y = \dfrac{(x+2)^2}{x^2+x+1}$ හි ප්‍රස්තාරය සන්තතික වේ.

$(0, 4)$ උපරිමයකි. 5

$(-2, 0)$ අවමයකි. 5

$y = 1$ විට $x^2+x+1 = x^2+4x+4 \Rightarrow 3x+3=0 \Rightarrow x=-1$

$y = \dfrac{x^2+4x+4}{x^2+x+1} = \dfrac{1+\frac{4}{x}+\frac{4}{x^2}}{1+\frac{1}{x}+\frac{1}{x^2}}$, $x \neq 0$ සඳහා

$x \to \pm\infty$ විට $y \to 1$ 5



60

(c) x^2+kx+1, x^4-12x^2+8x+3 හි සාධකයක් වන විට,

$x^4-12x^2+8x+3 \equiv (x^2+kx+1)(x^2+\lambda x+3)$ වන පරිදි $\lambda \in \mathbb{Z}$ පවතී.

5

$\Rightarrow \quad k+\lambda = 0$ සහ $\lambda + 3k = 8$ 5

$\Rightarrow \quad k = 4$ 5

$\Rightarrow \quad \lambda = -4$

$x^4-12x^2+8x+3 = 0$

$(x^2+4x+1)(x^2-4x+3) = 0$ 5

$x^2+4x+1 = 0$ හෝ $x^2-4x+3=0$

$x = \dfrac{-4 \pm \sqrt{16-4}}{2}$ හෝ $(x-1)(x-3) = 0$

$= -2 \pm \sqrt{3}$ 5 හෝ $x = 1$ හෝ $x = 3$ 5

30

[9 වන පිටුව බලන්න

12. (a) එක් ළමයකුට අඩුම තරමින්, රුපියල් තුනක්වත් ලැබිය යුතු බැවින් ඒ සඳහා රුපියල් 15ක් වෙන් කළ යුතු වේ. එවිට ඉතිරි රුපියල් තුන ළමයින් පස්දෙනා අතර පහත දැක්වෙන ආකාරවලට බෙදිය හැකි ය. 5

	මුදල් බෙදීම						ආකාර ගණන	
(i)	3	0	0	0	0	5	$\frac{5!}{4!} = 5$	5
(ii)	2	1	0	0	0	5	$\frac{5!}{3!} = 20$	5
(iii)	1	1	1	0	0	5	$\frac{5!}{3!2!} = 10$	5

$\therefore$ මුළු ආකාර ගණන $= 5 + 20 + 10$ 5
$= 35$

40

(b)



$a > b > 0$

$b|x-1| > |x-a|$ හි විසඳුම් කුලකය $\{x \mid 3 < x < 7\ ;\ x \in \mathbb{R}\}$ බැවින්,

$A \equiv (3, y_A)\ ;\ B \equiv (7, y_B)$ විය යුතුය. 5

y_A සැලකීමෙන්, $-3 + a = 3b - b \Rightarrow a - 2b = 3$ ——— (1) 5

එලෙසම y_B සැලකීමෙන්, $7 - a = 7b - b \Rightarrow a + 6b = 7$ ——— (2) 5

(1) සහ (2) න්, $a = 4,\ b = \frac{1}{2}$ 5

40

(c) $u_r \equiv \frac{A}{r+1} + \frac{B}{r+2} + \frac{C}{r+3} \equiv \frac{3r+1}{(r+1)(r+2)(r+3)}$ ලෙස ගනිමු. 5

එවිට $A(r+2)(r+3) + B(r+1)(r+3) + C(r+1)(r+2) \equiv 3r+1$ වේ.

r^2 හි සංගුණක සැලකීමෙන්, $A + B + C = 0$

r හි සංගුණක සැලකීමෙන්, $5A + 4B + 3C = 3$

නියත පද සැලකීමෙන්, $6A + 3B + 2C = 1$

10

ඉහත සමීකරණ විසඳීමෙන්, $A = -1, B = 5, C = -4$ 10

$\therefore u_r \equiv -\frac{1}{r+1} + \frac{5}{r+2} - \frac{4}{r+3}$

[10 වන පිටුව බලන්න

$$\equiv -\left(\frac{1}{r+1}-\frac{1}{r+2}\right)+4\left(\frac{1}{r+2}-\frac{1}{r+3}\right)$$ 5

මෙය $\lambda[f(r)-f(r+1)] + \mu[f(r+1)-f(r+2)]$ ආකාර වේ.

මෙහි $\lambda = -1$, $\mu = 4$ සහ $f(r)=\left(\frac{1}{r+1}\right)$ වේ. 5
5

$$u_r \equiv \lambda[f(r)-f(r+1)] + \mu[f(r+1)-f(r+2)]$$

$$\therefore u_1 = \lambda[f(1)-f(2)] + \mu[f(2)-f(3)]$$

$$u_2 = \lambda[f(2)-f(3)] + \mu[f(3)-f(4)]$$ 5

$$\vdots$$

$$u_{n-1} = \lambda[f(n-1)-f(n)] + \mu[f(n)-f(n+1)]$$

$$u_n = \lambda[f(n)-f(n+1)] + \mu[f(n+1)-f(n+2)]$$ 5

එකතු කිරීමෙන්,

$$\sum_{r=1}^{n} u_r = \lambda[f(1)-f(n+1)] + \mu[f(2)-f(n+2)]$$

$$= -1\left[\frac{1}{2}-\frac{1}{n+2}\right]+4\left[\frac{1}{3}-\frac{1}{n+3}\right]$$ 5

$$= \frac{5}{6}+\frac{1}{n+2}-\frac{4}{n+3}$$

$$= \frac{5}{6}-\frac{3n+5}{(n+2)(n+3)}$$

$$\lim_{n\to\infty}\sum_{r=1}^{n} u_r = \lim_{n\to\infty}\left[\frac{5}{6}+\frac{1}{n+2}-\frac{4}{n+3}\right]$$

$$= \frac{5}{6}$$ 5

$\Rightarrow \lim_{n\to\infty}\sum_{r=1}^{n} u_r$ පරිමිත වන බැවින් ශ්‍රේණිය අභිසාරී වේ. 5

තවද සියලු $r \in \mathbb{Z}^+$ සඳහා $u_r > 0$ වේ.

$\therefore u_1 \le S_n < S_\infty$ 5

$$\Rightarrow \frac{1}{6} \le \frac{5}{6}-\frac{3n+5}{(n+2)(n+3)} < \frac{5}{6}$$

$\boxed{70}$

[11 වන පිටුව බලන්න

13. (a) $\mathbf{P} = \begin{pmatrix} -5 & 3 \\ 6 & -2 \end{pmatrix}$

$$\mathbf{P}-\lambda\mathbf{I} = \begin{pmatrix} -5 & 3 \\ 6 & -2 \end{pmatrix} - \lambda\begin{pmatrix} 1 & 0 \\ 0 & 1 \end{pmatrix}$$

$$= \begin{pmatrix} -5-\lambda & 3 \\ 6 & -2-\lambda \end{pmatrix} \quad 5$$

$$\det(\mathbf{P}-\lambda\mathbf{I}) = 0$$

$$\Rightarrow \begin{vmatrix} -5-\lambda & 3 \\ 6 & -2-\lambda \end{vmatrix} = 0 \quad 5$$

$$\Rightarrow (5+\lambda)(2+\lambda)-18 = 0 \quad 5$$

$$\Rightarrow \lambda^2+7\lambda-8 = 0$$

$$\Rightarrow (\lambda-1)(\lambda+8) = 0$$

$\Rightarrow \lambda = 1$ හෝ $\lambda = -8$ 5

$$\mathbf{PX} = \lambda\mathbf{X}$$

$$\Rightarrow \begin{pmatrix} -5 & 3 \\ 6 & -2 \end{pmatrix}\begin{pmatrix} x \\ y \end{pmatrix} = \lambda\begin{pmatrix} x \\ y \end{pmatrix} \Rightarrow \begin{pmatrix} -5x+3y \\ 6x-2y \end{pmatrix} = \begin{pmatrix} \lambda x \\ \lambda y \end{pmatrix}$$

$\lambda = 1$ වන විට, $\left.\begin{aligned} -5x+3y &= x \\ 6x-2y &= y \end{aligned}\right\} \Rightarrow \begin{aligned} -6x+3y &= 0 \\ 6x-3y &= 0 \end{aligned}$ 5

ඉහත සමීකරණ දෙක එකිනෙකට තුල්‍ය බැවින්,
$x = t$ යැයි ගත්විට $y = 2t$ වේ. මෙහි t යනු තාත්ත්වික පරාමිතියකි.

$$\therefore X = \begin{pmatrix} t \\ 2t \end{pmatrix} = t\begin{pmatrix} 1 \\ 2 \end{pmatrix} \quad 5$$

$\lambda = -8$ වන විට, $\left.\begin{aligned} -5x+3y &= -8x \\ 6x-2y &= -8y \end{aligned}\right\} \Rightarrow \begin{aligned} 3x+3y &= 0 \\ 6x+6y &= 0 \end{aligned}$ 5

මෙම සමීකරණ දෙක ද එකිනෙකට තුල්‍ය බැවින්,
$x = T$ යැයි ගත්විට $y = -T$ වේ. මෙහි T යනු තාත්ත්වික පරාමිතියකි.

$$\therefore X = \begin{pmatrix} T \\ -T \end{pmatrix} = T\begin{pmatrix} 1 \\ -1 \end{pmatrix} \quad 5$$

$\boxed{40}$

(b)



P සහ Q යනු පිළිවෙළින් $OP \,//\, A_3A_1, OP = A_3A_1$ සහ $OQ \,//\, A_4A_2, OQ = A_4A_2$ වන පරිදි වූ ලක්ෂ්‍ය දෙකකි.

එවිට $z_P = z_1 - z_3$ සහ $z_Q = z_2 - z_4$ වේ. 10

$$\left|\frac{z_1 - z_3}{z_2 - z_4}\right| = \frac{|z_1 - z_3|}{|z_2 - z_4|} = \frac{OP}{OQ} = \frac{A_1A_3}{A_2A_4}$$ 10

$$\arg\left(\frac{z_1 - z_3}{z_2 - z_4}\right) = \arg(z_1 - z_3) - \arg(z_2 - z_4) = \theta - \beta = P\hat{O}Q$$

$\beta > \theta$ විට $|\theta - \beta| = P\hat{O}Q$ වේ.

$P\hat{O}Q = A_1A_3$ සහ A_2A_4 අතර කෝණය වේ. 10

එබැවින්, $\dfrac{z_1 - z_3}{z_2 - z_4}$ හුදෙක් අතාත්වික වීම සඳහා $A_1A_3 \perp A_2A_4$ විය යුතුය. 5

$\boxed{35}$



$z^2 - 2z + 2 = 0 \quad \Rightarrow \quad z = 1 \pm i$

$z^2 - 2az + b = 0 \quad \Rightarrow \quad z = a \pm i\sqrt{b - a^2}$

(i) $C\hat{O}D = \dfrac{\pi}{2}$ නම්,

$\dfrac{a + i\sqrt{b - a^2}}{a - i\sqrt{b - a^2}}$ හුදෙක් අතාත්වික වේ. 5

$$\frac{a + i\sqrt{b - a^2}}{a - i\sqrt{b - a^2}} = \frac{a^2 - (b - a^2) + 2ia\sqrt{b - a^2}}{a^2 + (b - a^2)}$$

හුදෙක් අතාත්ත්වික වීම සඳහා තාත්ත්වික කොටස $= 0 \Rightarrow 2a^2 = b$ 10

(ii) $OA = OB = OC = OD$

$\therefore \; z_A\bar{z}_A = z_D\bar{z}_D$ 5

$\Rightarrow \; 2 = a^2 + b - a^2$ 10

$\Rightarrow \; b = 2$

(iii) $ABCD$ සමචතුරස්‍රයක් ද එහි කේන්ද්‍රය O ද වන විට, සමමිතිකත්වයෙන්, 5

$a = -1$ සහ $\sqrt{b - a^2} = 1$

$\Rightarrow \; b = 2$ 10



$\boxed{45}$

[13 වන පිටුව බලන්න

(c) $\arg[(z+i)i] = \dfrac{2\pi}{3}$



$$\arg(z+i) + \arg i = \frac{2\pi}{3}$$

$$\therefore \arg(z+i) = \frac{2\pi}{3} - \frac{\pi}{2} = \frac{\pi}{6} \quad (5)$$

$$\Rightarrow \arg(z-(-i)) = \frac{\pi}{6} \quad (5)$$

$$\therefore P\hat{A}X' = \frac{\pi}{6}\,;\, P \neq A \quad (5)$$

P හි පථය රූපයේ දැක්වෙන පරිදි අඩ සරල රේඛාවක් වේ.

$OP = |z|$ (5)

$$\therefore |z|_{\text{අඩුතම}} = ON = 1.\cos\frac{\pi}{6} = \frac{\sqrt{3}}{2} \quad (5)$$

$$z_N = \left\{\frac{\sqrt{3}}{2}\cos\frac{\pi}{3} - i\frac{\sqrt{3}}{2}\sin\frac{\pi}{3}\right\}$$

$$= \frac{\sqrt{3}}{4} - \frac{3}{4}i \quad (5)$$

$\boxed{30}$

---

14. (a) $f(x) = \dfrac{3-4x}{x^2+1}$, $x \in \mathbb{R}$

$$f'(x) = \frac{(x^2+1)(-4)-(3-4x)2x}{(x^2+1)^2} \ (10) = \frac{2(2x+1)(x-2)}{(x^2+1)^2}$$

$x = -\dfrac{1}{2}$ සහ $x = 2$ දී $f'(x) = 0$ (10) බැවින් හැරුම් ලක්ෂ්‍ය දෙකක් ඇත.

සියලු $x \in \mathbb{R}$ සඳහා f ශ්‍රිතය සන්තතික වේ.

x	$-\infty < x < -\frac{1}{2}$	$-\frac{1}{2} < x < 2$	$2 < x < \infty$
$f'(x)$	$\frac{(-)(-)}{(+)} > 0$	$\frac{(+)(-)}{(+)} < 0$	$\frac{(+)(+)}{(+)} > 0$

(10)

$x = -\dfrac{1}{2}$, $y = 4$ උපරිමයකි. (5)

$x = 2, y = -1$ අවමයකි. (5)

$x = 0$ විට $y = 3$

$x = \dfrac{3}{4}$ විට $y = 0$ (5)

$$y = \frac{3/x^2 - 4/x}{1 + 1/x^2}$$

$x \to \pm\infty,\ y \to 0$ (5)



$|3-4x|e^{x}-x^{2}-1=0$ ———— (1)

$e^{-x} = \dfrac{|3-4x|}{x^{2}+1}$ 5

(1) සමීකරණයේ මූල වන්නේ, $y=e^{-x}$ වක්‍රය සහ $y=\dfrac{|3-4x|}{x^{2}+1}$ වක්‍රය ඡේදනය වන ලක්ෂ්‍යවල x - ඛණ්ඩාංකයි. 5

∴ ප්‍රස්තාරයට අනුව, (1)සමීකරණයට අඩුම වශයෙන් තාත්ත්වික ප්‍රභින්න මූල තුනක් ඇත. 5



90

(b)



$AB=x$ වන විට, ජනිත ඝන වස්තුවේ පරිමාව V යැයි ගනිමු.
එවිට $BC=2s-2x$,

$BD = \dfrac{2s-2x}{2} = s-x$ 5

$AD = \sqrt{AB^{2}-BD^{2}} = \sqrt{x^{2}-(s-x)^{2}} = \sqrt{2sx-s^{2}}$

$= \sqrt{s(2x-s)}$ 5 ; $x > \dfrac{s}{2}$ 5

$V = \dfrac{1}{3}\pi AD^{2}.\,2BD$ 5

$= \dfrac{1}{3}\pi s(2x-s).\,2(s-x)$ 5

$= \dfrac{2\pi}{3}\, s(2x-s)(s-x)$

$\dfrac{dV}{dx} = \dfrac{2}{3}\pi s[(2x-s)(-1)+(s-x)2]$ 5

$= \dfrac{2}{3}\pi s[-2x+s+2s-2x]$

$= \dfrac{2}{3}\pi s(3s-4x)$ 5

$x = \dfrac{3}{4}s$ විට $\dfrac{dV}{dx} = 0$ වේ. 5

$\dfrac{s}{2} < x < \dfrac{3s}{4}$ විට $\dfrac{dV}{dx} > 0$ වේ ; V වැඩිවේ.

$\dfrac{3s}{4} < x < s$ විට $\dfrac{dV}{dx} < 0$ වේ ; V අඩුවේ. 10

∴ $x = \dfrac{3}{4}s$ වන විට V උපරිම වේ. 5

∴ පරිමාව උපරිම වන පරිදි AB දිග $\dfrac{3}{4}s$ වේ. 5

60

[15 වන පිටුව බලන්න

15. (a) $\dfrac{x^2+3x+5}{(x-1)(x+2)} \equiv A+\dfrac{B}{x-1}+\dfrac{C}{x+2}$

$\Rightarrow x^2+3x+5 \equiv A(x-1)(x+2)+B(x+2)+C(x-1)$

x^2 හි සංගුණක සැසඳීමෙන්, $A=1$ 5

$x=1$ විට $B=3$ 5

$x=-2$ විට $C=-1$ 5

$$\therefore \int_0^2 \frac{x^2+3x+5}{(x-1)(x+2)}\,dx = \int_0^2 dx + 3\int_0^2 \frac{1}{x-1}\,dx - \int_0^2 \frac{1}{x+2}\,dx \quad 5$$

$$= [x]_0^2 + 3\big[\ln|x-1|\big]_0^2 - \big[\ln|x+2|\big]_0^2 \quad 10$$

$$= 2+3\,[\ln 1-\ln 1]-[\ln 4-\ln 2]$$

$$= 2-\ln 2 \quad 5$$

$\boxed{35}$

(b) $$\int e^{2x}\sin 3x\ dx = \int \sin 3x\ \frac{d}{dx}\left(\frac{e^{2x}}{2}\right) dx \quad 5$$

$$= \frac{1}{2}e^{2x}\sin 3x - \int \frac{1}{2}e^{2x}3\cos 3x\ dx + C \quad 10$$

$$= \frac{1}{2}e^{2x}\sin 3x - \frac{3}{2}\left[\frac{1}{2}e^{2x}\cos 3x - \frac{1}{2}\int e^{2x}(-3\sin 3x)dx\right] + C' \quad 10$$

$$= \frac{1}{2}e^{2x}\sin 3x - \frac{3}{4}e^{2x}\cos 3x - \frac{9}{4}\int e^{2x}\sin 3x\ dx + C' \quad 5$$

$$\Rightarrow \frac{13}{4}\int e^{2x}\sin 3x\ dx = \frac{1}{4}e^{2x}(2\sin 3x-3\cos 3x)+C' \quad 10$$

$$\Rightarrow \int e^{2x}\sin 3x\ dx = \frac{1}{13}e^{2x}(2\sin 3x-3\cos 3x)+C$$; මෙහි C අභිමත නියතයකි. 5

$\boxed{45}$

(c) $$I = \int_0^1 \frac{1}{x+\sqrt{1-x^2}}\,dx$$

$x = \sin\theta$

$\dfrac{dx}{d\theta} = \cos\theta$

$x=1$ නම්, $\theta=\dfrac{\pi}{2}$

$x=0$ නම්, $\theta=0$ 5

$$\therefore I = \int_0^{\frac{\pi}{2}} \frac{\cos\theta}{\sin\theta+\sqrt{1-\sin^2\theta}}\,d\theta \quad 5$$

$$= \int_0^{\frac{\pi}{2}} \frac{\cos\theta}{\sin\theta+\cos\theta}\,d\theta \text{ ——— (1)}$$

[16 වන පිටුව බලන්න

$\theta = \dfrac{\pi}{2} - t$ නම්,

$\dfrac{d\theta}{dt} = -1$ 5

$\theta = 0$ නම්, $t = \dfrac{\pi}{2}$

$\theta = \dfrac{\pi}{2}$ නම්, $t = 0$ 5

$$\therefore \mathrm{I} = \int_{\frac{\pi}{2}}^{0} \frac{\sin t}{\cos t + \sin t} (-dt)$$

$$= \int_{0}^{\frac{\pi}{2}} \frac{\sin t}{\cos t + \sin t}\, dt \qquad 5$$

t, θ මගින් ප්‍රතිස්ථාපනය කිරීමෙන්,

$$\mathrm{I} = \int_{0}^{\frac{\pi}{2}} \frac{\sin\theta}{\cos\theta + \sin\theta}\, d\theta \text{ ——— } (2) \qquad 5$$

$$(1) + (2)\ ; \quad 2\mathrm{I} = \int_{0}^{\frac{\pi}{2}} d\theta = [\theta]_0^{\pi/2} \qquad 5 + 5$$

$$\therefore \mathrm{I} = \frac{\pi}{4}$$

$\boxed{40}$

(d) $S = \{(x, y) : x^2 \le y \le |x|\}$ ලෙස ගනිමු.



$y = x$ සහ $y = x^2$ විසඳීමෙන්

$A \equiv (1, 1)$ 5

$$S_1 = \frac{1}{2} \times 1 \times 1 - \int_0^1 x^2\, dx \qquad 5$$

$$= \frac{1}{2} - \left[\frac{x^3}{3}\right]_0^1 = \frac{1}{2} - \left(\frac{1}{3}\right) \qquad 5$$

$$= \frac{3-2}{6} = \frac{1}{6}$$

$\therefore$ ආවෘත වර්ගඵලය $2S_1 = \dfrac{1}{3}$ වර්ග ඒකක 5

$\boxed{30}$

[17 වන පිටුව බලන්න

16. (a) $A \equiv \left(\frac{4}{3}, \frac{5}{3}\right)$ 5



$B \equiv (4, 3)$ 5

AD රේඛාවේ සමීකරණය,

$y - \frac{5}{3} = -1\left(x - \frac{4}{3}\right)$ 10

$y - \frac{5}{3} = -x + \frac{4}{3}$

$x + y - 3 = 0$ 5

$BD \,//\, AC$ නිසා, BD රේඛාවේ සමීකරණය $2x - y - k = 0$ ලෙස ගත හැකිය. මෙහි k නියතයකි. 5

එය B හරහා යන නිසා, $8 - 3 - k = 0$

$\therefore\ k = 5$ 5

$\therefore$ BD රේඛාවේ සමීකරණය $2x - y - 5 = 0$ 5

$C \equiv (0, -1)$ 5

$D \equiv \left(\frac{8}{3}, \frac{1}{3}\right)$ 5

$\therefore$ CD අනුක්‍රමණය $= \dfrac{\frac{1}{3}+1}{\frac{8}{3}-0} = \frac{1}{2}$ 5

AB අනුක්‍රමණය $= \dfrac{3-\frac{5}{3}}{4-\frac{4}{3}} = \frac{1}{2}$ 5

$\therefore\ AB \,//\, CD$ 5

තවද $BD \,//\, AC$ ද වන බැවින්, $ABCD$ සමාන්තරාස්‍රයකි. 5

එහි විකර්ණ ලම්බ වන බැවින්, $ABDC$ රොම්බසයකි. 5

$\boxed{75}$

(b) $|r_1 - r_2| < C_1C_2 < r_1 + r_2$ 10

$x^2 + y^2 + 6x + 2fy = 0$ සහ $x^2 + y^2 - 2y - 3 = 0$ වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදනය වේ නම්,

$2.3.0 + 2f(-1) = 0 + (-3)$ 10

$\Rightarrow\ f = \frac{3}{2}$

$S_1 \equiv x^2 + y^2 + 6x + 2fy = 0$ සහ $S_2 \equiv x^2 + y^2 - 2y - 3 = 0$ වෘත්ත දෙක $P_1(x_1, y_1)$ සහ $P_2(x_2, y_2)$ ලක්ෂ්‍ය දෙකෙහිදී ඡේදනය වන්නේ යැයි ගනිමු.

$S_1 + \lambda S_2 = 0 \Rightarrow (1+\lambda)x^2 + (1+\lambda)y^2 + 6x + 2(f-\lambda)y - 3\lambda = 0$

$\therefore$ λ පරාමිතියක් වන විට,

මෙම සමීකරණය මගින් වෘත්තයක් නිරූපණය වේ. 5

$S_1 = 0$ වෘත්තය $P_1(x_1, y_1)$ හරහා යන නිසා, $x_1^2 + y_1^2 + 6x_1 + 2fy_1 = 0$ ——— (1)

$S_2 = 0$ වෘත්තය $P_1(x_1, y_1)$ හරහා යන නිසා, $x_1^2 + y_1^2 - 2y_1 - 3 = 0$ ——— (2)

(1) + λ(2) න්, $(1+\lambda)x_1^2 + (1+\lambda)y_1^2 + 6x_1 + 2(f-\lambda)y_1 - 3\lambda = 0$

එනම් $S_1 + \lambda S_2 = 0$ වෘත්තය $P_1(x_1, y_1)$ ලක්ෂ්‍යය හරහා යයි. 10

එලෙසම, $S_1 + \lambda S_2 = 0$ වෘත්තය $P_2(x_2, y_2)$ ලක්ෂ්‍යය හරහා ද යන බව පෙන්විය හැකිය. 5

[18 වන පිටුව බලන්න

$\therefore$ $S_1 + \lambda S_2 = 0$ මගින් $S_1 = 0$ සහ $S_2 = 0$ වෘත්ත දෙකෙහි ඡේදන ලක්ෂ්‍ය හරහා යන ඕනෑම වෘත්තයක් නිරූපණය වේ. මෙහි λ පරාමිතියකි.

(i) $S_1 + \lambda S_2 \equiv (1+\lambda)x^2 + (1+\lambda)y^2 + 6x + 2(f-\lambda)y - 3\lambda = 0$. මෙහි $f = \frac{3}{2}$

මෙය $(-2, 2)$ ලක්ෂ්‍ය හරහා යන විට, $(1+\lambda)4 + (1+\lambda)4 - 12 + 2(\frac{3}{2} - \lambda)(2) - 3\lambda = 0$ (10)

$\Rightarrow\ 8 - 12 + 6 + 8\lambda - 4\lambda - 3\lambda = 0$

$\Rightarrow\ 2 + \lambda = 0$

$\Rightarrow\ \lambda = -2$

$\therefore$ අවශ්‍ය වෘත්තයේ සමීකරණය $\quad -x^2 - y^2 + 6x + 7y + 6 = 0$

$x^2 + y^2 - 6x - 7y - 6 = 0$ (5)

(ii) පොදු ජ්‍යායේ සමීකරණය, $S_1 - S_2 = 0$

$6x + (2f + 2)y + 3 = 0$

$6x + 5y + 3 = 0$ (5)

$S_1 + \lambda S_2 = (1+\lambda)x^2 + (1+\lambda)y^2 + 6x + 2(f-\lambda)y - 3\lambda = 0$

කේන්ද්‍රය $\equiv \left[-\frac{3}{1+\lambda}, \frac{\lambda - f}{1+\lambda}\right]$ (5)

කුඩාම වෘත්තයේ කේන්ද්‍රය, පොදු ජ්‍යාය මත පිහිටන බැවින්,

$6\left(-\frac{3}{1+\lambda}\right) + 5\left(\frac{\lambda - f}{1+\lambda}\right) + 3 = 0$ මෙහි $f = \frac{3}{2}$ (5)

$-18 + 5\lambda - 5f + 3 + 3\lambda = 0$

$8\lambda = 18 - 3 + \frac{15}{2} = \frac{45}{2} \Rightarrow \lambda = \frac{45}{16}$

$\therefore$ අවශ්‍ය වෘත්තයේ සමීකරණය $\quad \frac{61}{16}x^2 + \frac{61}{16}y^2 + 6x + 2\left(\frac{3}{2} - \frac{45}{16}\right)y - \frac{135}{16} = 0$

$61x^2 + 61y^2 + 96x - 42y - 135 = 0$ (5)

75

---

17. (a) $\cos A + \cos B + \cos C = \frac{3}{2}$

$1 - 2\sin^2\frac{A}{2} + 2\cos\frac{B+C}{2}\cos\frac{B-C}{2} = \frac{3}{2}$ (10)

$A + B + C = \pi$ නිසා, $\quad 2\cos\left(\frac{\pi}{2} - \frac{A}{2}\right)\cos\frac{B-C}{2} - 2\sin^2\frac{A}{2} = \frac{1}{2}$

$2\sin\frac{A}{2}\left[\cos\frac{B-C}{2} - \sin\frac{A}{2}\right] = \frac{1}{2}$ (5)

$\cos\frac{B-C}{2} - \sin\frac{A}{2} = \frac{1}{4\sin\frac{A}{2}}$

$\Rightarrow \cos\frac{B-C}{2} \quad = \quad \sin\frac{A}{2} + \frac{1}{4\sin\frac{A}{2}}$

[19 වන පිටුව බලන්න

$$= \frac{4\sin^2\frac{A}{2}+1}{4\sin\frac{A}{2}} \quad (5)$$

$$= \frac{\left(1-2\sin\frac{A}{2}\right)^2+4\sin\frac{A}{2}}{4\sin\frac{A}{2}} \quad (5)$$

$$= \frac{\left(1-2\sin\frac{A}{2}\right)^2}{4\sin\frac{A}{2}}+1$$

$\cos\frac{B-C}{2} \leq 1$ නිසා $\frac{\left(1-2\sin\frac{A}{2}\right)^2}{4\sin\frac{A}{2}}+1 \leq 1$ (5)

$\Rightarrow \frac{\left(1-2\sin\frac{A}{2}\right)^2}{\sin\frac{A}{2}} \leq 0$ (5)

$0<A<\pi$ නිසා $\sin\frac{A}{2}>0$ වේ. $\therefore\ 1-2\sin\frac{A}{2}=0$ විය යුතුය.

එවිට $\cos\frac{B-C}{2}=1$ සහ $\sin\frac{A}{2}=\frac{1}{2}$ (5)

$\Rightarrow B=C$ සහ $A=\frac{\pi}{3}$ (5) ; $0<A<\pi$ නිසා,

$\Rightarrow A=B=C=\frac{\pi}{3}$

$\Rightarrow ABC$ ත්‍රිකෝණය සමපාද වේ.

$\boxed{45}$

(b) $f(\theta) \equiv 3\cos^2\theta+10\sin\theta\cos\theta+27\sin^2\theta$

$\equiv \frac{3}{2}[1+\cos2\theta]+5\sin2\theta+\frac{27}{2}[1-\cos2\theta]$ (5)

$\equiv 15-12\cos2\theta+5\sin2\theta$

$\equiv 15-13\left[\frac{12}{13}\cos2\theta-\frac{5}{13}\sin2\theta\right]$ (5)

$\equiv 15-13[\cos2\theta\cos\alpha-\sin2\theta\sin\alpha]$ (5) මෙහි $\cos\alpha=\frac{12}{13}$ සහ $\sin\alpha=\frac{5}{13}$ (5)

වන පරිදි $0<\alpha<\frac{\pi}{2}$

$\equiv 15-13\cos(2\theta+\alpha)$

$\therefore\ f(\theta)=a+b\cos(2\theta+\alpha)$ ආකාරය වේ.

මෙහි $a=15,\ b=-13$ (5), $\alpha=\cos^{-1}\left(\frac{12}{13}\right)=\sin^{-1}\left(\frac{5}{13}\right)$ (5) වේ. $0<\alpha<\frac{\pi}{2}$

$f(\theta)\equiv 15-13\cos(2\theta+\alpha)$; මෙහි $\alpha=\cos^{-1}\left(\frac{12}{13}\right)=\sin^{-1}\left(\frac{5}{13}\right)$

[20 වන පිටුව බලන්න

සියලු θ සඳහා $f(\theta)$ සන්තතික වේ.

$\theta = 0$ වන විට $f(0) = 15 - 13\cos\alpha = 15 - 12 = 3$

$\theta = \pi$ වන විට $f(\pi) = 15 - 13\cos(2\pi + \alpha) = 15 - 13\cos\alpha = 3$

$-1 \le \cos(2\theta + \alpha) \le 1 \quad \Rightarrow \quad -13 \le 13\cos(2\theta + \alpha) \le 13 \quad \Rightarrow \quad -13 \le -13\cos(2\theta + \alpha) \le 13$

5 $\quad \Rightarrow \quad 2 \le 15 - 13\cos(2\theta + \alpha) \le 28$

$\Rightarrow \quad 2 \le f(\theta) \le 28$ 5

අවම ලක්ෂ්‍යයේදී $f(\theta) = 2$. එවිට $\cos(2\theta + \alpha) = 1 \Rightarrow 2\theta + \alpha = 2n\pi$; මෙහි $n \in \mathbb{Z}$ 5

$\theta = n\pi - \dfrac{\alpha}{2} = \pi - \dfrac{\alpha}{2}$, $\theta \in [0, \pi]$ නිසා 5

උපරිම ලක්ෂ්‍යයේදී $f(\theta) = 28$. එවිට $\cos(2\theta + \alpha) = -1 \Rightarrow 2\theta + \alpha = 2n\pi \pm \pi$, $n \in \mathbb{Z}$ 5

$\theta = n\pi \pm \dfrac{\pi}{2} - \dfrac{\alpha}{2} = \dfrac{\pi}{2} - \dfrac{\alpha}{2}$, $\theta \in [0, \pi]$ නිසා 5

$f(\theta) \ne 0$ වේ.



$f(\theta) - k = 0$ සමීකරණයට

(i) එක් විසඳුමක් පමණක් ඇත්තේ, $k = 2$ වන විට හා $k = 28$ වන විට ය. 5

(ii) විසඳුම් දෙකක් ඇත්තේ, $2 < k < 3$ වන විට හා $3 < k < 28$ වන විට ය. 5

(iii) විසඳුම් තුනක් ඇත්තේ, $k = 3$ වන විට ය. 5

(iv) විසඳුම් නොමැත්තේ, $k < 2$ වන විට හා $k > 28$ වන විට ය. 5

$\boxed{90}$

(c) $\sin^{-1}\sqrt{\dfrac{2}{3}} - \sin^{-1} x = \dfrac{\pi}{2}$

5

$\alpha = \sin^{-1}\sqrt{\dfrac{2}{3}}$ ද $\beta = \sin^{-1} x$ ද යැයි ගනිමු.

එවිට $\alpha - \beta = \dfrac{\pi}{2} \Rightarrow \alpha = \dfrac{\pi}{2} + \beta$

$\Rightarrow \cos\alpha = \cos\left(\dfrac{\pi}{2} + \beta\right)$

$= -\sin\beta$ 5

$\Rightarrow \dfrac{1}{\sqrt{3}} = -x$

$\Rightarrow x = -\dfrac{1}{\sqrt{3}}$ 5

$\alpha = \sin^{-1}\sqrt{\dfrac{2}{3}} \qquad 0 < \alpha < \dfrac{\pi}{2}$

$\sin\alpha = \sqrt{\dfrac{2}{3}}$

$\cos\alpha = \sqrt{1 - \dfrac{2}{3}}$

$= \sqrt{\dfrac{1}{3}}$

$\boxed{15}$

A කොටස

1. නැවට සාපේක්ෂව බෝට්ටුවේ පෙත :



$DC = \sqrt{24^2 + 7^2}$ km $= 25$ km

$\tan\alpha = \dfrac{7}{24}$ (5)

S - නැව, B - බෝට්ටුව, E - පොළව

(i) $V_{B,S} =$  $\dfrac{25}{2}$ km h^{-1} (5)

නැව හා බෝට්ටුව අතර කෙටිම දුර $= 24\sin\alpha$ km

$= 24 \cdot \dfrac{7}{25}$ km

$= \dfrac{168}{25}$ km (5)

(ii) $V_{B,E} = V_{B,S} + V_{S,E}$

$=$  (5) $\quad \tan\theta = \dfrac{12}{5}$

$=$ 

$13\sin\theta - \dfrac{25}{2}\cos\alpha$

$= 13 \cdot \dfrac{12}{13} - \dfrac{25}{2} \cdot \dfrac{24}{25}$

$= 12 - 12$

$= 0$

$\dfrac{25}{2}\sin\alpha - 13\cos\theta$

$= \dfrac{25}{2} \cdot \dfrac{7}{25} - 13 \cdot \dfrac{5}{13}$

$= \dfrac{7}{2} - 5$

$= -\dfrac{3}{2}$

$\therefore V_{B,E} = \uparrow \dfrac{3}{2}$ km h^{-1} (උතුරට) (5)

$\boxed{25}$

2. $AB \perp BC$ සහ $AD \perp DC$ නිසා,
A ට යෙදෙන ආවේගය අනුව AB සහ AD තන්තු දිගේ
I_1 හා I_2 ආවේග ඇති වුවත් BC සහ DC තන්තු දිගේ
ආවේග ඇති නොවේ. (5)
තන්තු අවිතන්‍ය බැවින්,
